අපේ ඩෙස්ටිනි එක බාර ගන්න කවුරු හරි සූදානම් වෙනවා නම් ඒක මහා මෝඩ කමක්.. මහා දුර්වල කමක්.. ”

ජීවිතය නම් වන පුදසුන මත පර මලක් පිදුවද එය උතුම්ම පූජාවක් වන්නේ ය.

000000000000

“දැන් මොකද්ද මෙතන මේ වෙන්නෙ.. අක්ක කියන්නෙත් නෑ ඔයා කියන්නෙත් නෑ.. අම්මල අරහෙ හූල්ලනවා හරියාකාර විස්තරයක් දන්නැතුව..” චතුරි ගේ කටහඬෙහි සැඟව ඇත්තේ කෝපයකට වඩා දෝශාරෝපනයක් යයි නිමන්තට සිතුණි. චතුරි කියනා දේ අනුමත කරන බැල්මක් තමන් දෙස යොමා සිටිනා මිලින්ද දෙස හෝ නොබලා නිමන්ත ඉවත බලා සිටියේ කුමක් කිව යුතුදැයි සිතා ගත නොහැකිව ය.

හරියාකාරව පැහැදිළි කළ නොහැකි මේ සිදුවීම් දාමය වෙනත් කිසිවකුට තේරුම් කර දිය හැකිවන්නේ කෙලෙසදැයි ඔහුට සිතා ගත නොහැකි විය. මේ මොහොතේ දිය හැකිවන්නේ ඉතා සරළ පිළිතුරකි.

“වෙන්නෙ මොනාද කියල මං කිසිම දෙයක් දන්නෑ නංගි..”

“එහෙම කියල කොහොමද..? මේක සෙල්ලමක් ද..?” චතුරි ඒ ප්‍රශ්නය අසන්නට කලින් සූදානම්ව සිටියා සේ වහා ඇසුවා ය.

“ඒක අහන්න ඕනෙ මගෙන් නෙවෙයි නංගි... ඔයාගෙ අක්කගෙන්.. එයා මගේ ජීවිතෙන්

***<u>එයා අපි හැමෝම අත්ඇරලා යන්න හිත හදාගෙන ඉවරයි.. එයා මේ පේන්ටින්ග්ස් කරමින් ලෝකයෙන් ඈත්වෙලා ඉන්නෙ එයාගෙ ගමනට කාලය ගන්න විතරයි..</u>***

ඈත්ව ගිහින් කියන එක දැන දැන මගෙන් මේ ප්‍රශ්න අහන එකේ කිසිම තේරුමක් නැහැ.. ඇත්තමට මං දැන් පිටස්තරයෙක් ගානයි..” නිමන්ත කීවේ පුටුවෙන් නැගිටින අතර ය. මෙතැනින් ඉක්මණින් පිටව යන්නට ඔහුට අවශ්‍යව තිබුණි. මිලින්ද ඔහුගේ අතින් අල්ලා වාඩිවන්නැයි සන් කළේ ය. නිමන්ත නැවත වාඩිවූයේ ය.

“අපි හැමෝම කලබල වෙලා ඉන්නෙ අයියා..” මිලින්ද කීවේ ය. “.. ගෙවෙන හැම තත්පරයක් පාසාම ඒ කලබලේ ...ඒ නොසන්සුන්කම... වැඩි වෙනවා.. ඒක චතුරිට වගේම මටත් දැනෙනවා අයියා..” මිලින්ද කතා කළේ සන්සුන් හඬකිනි. වෛද්‍යවරයකු ලෙස ඔහුගේ දැනුම හා අත්දැකීම් විසින් ඇති කරනු ලැබූ අමන්දි පිළිබඳ අවිනිශ්චිතතාව මැඩ ගනිමින් ඔහු තැන්පත්ව සිටින්නට උත්සාහ කළේ ය.

“අමන්දිත් මාත් අතරෙ කිසිම කොමියුනිකේෂන් එකක් දැන් නැහැ මල්ලි.. එයා අන්තිමට මට කතා කළේ කවදද කියලවත් මට මතක නැහැ.. එයා ඊයෙ කොහේද ගිහින්.. මට හිතෙන්නෙ පේන්ටින්ග්ස් වලට දුරක ගිහින්.. පේන්ටින්ග්ස් දැන් එයාගෙ ආත්මය වගේ වෙලා.. වෙනින් ජීවිතයක් එයාට නැහැ වගේ..” නිමන්ත කතාව නවතා මොහොතක් බලා සිටියේ ය. පෙරදා විශ්ව කතා කළ බවත් අමන්දි දේශීය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුකරන්නට විශ්ව අදහස් කරගෙන සිටින බවත් නොකියා සිටීම යෙහෙකැයි ඔහුට සිතෙයි. ඒ යෝජනාවට බටහිර වෛද්‍යවරයකු වන මිලින්ද එකහෙළා විරුද්ධ වනු ඇතැයි ඔහු අනුමාන කළේ ය. “.. අමා සම්බන්ධ මොනයම් දෙයක් හෝ වෙනවනම් ඒ හැම දෙයක්ම තීරණය කරන්නෙ එයාම විතරයි.. දැන් මං එයාගෙ ජීවිතයේ පිටස්තරයෙක්


ජගත් ජේ එදිරිසිංහ ලියයි


ජනක රත්නායක ඇඳියි

විතරයි.. තේරුම් ගන්න.. ”

“ඔයා විතරක් නෙවෙයි අයියෙ.. දැන් අපිත් ඒ වගේ තමයි.. පහුගිය කාලෙම අක්ක අපිත් එක්කවත් කතා කළේ නැහැ.. අපි කතා කරනවට කැමැත්තක් පෙන්නුවෙත් නැහැ.. මා එකක් කතා කළ අන්තිම දා එයා කිව්වෙ හැම දෙයක් ගැනම තියෙන සියලුම බැඳීම් වලින් නිදහස් වෙලා ඉවරයි කියලයි.. ඒත් මං ඒක මහ විසාලෙට ගණන් ගත්තෙ නැහැ..”

“එයාම ඔයාට එහෙම කිව්ව නම් ඒක ඇත්ත කියලා පිළිගන්න.. මං හොඳින්ම ඒක දන්නවා.. එයා අපි හැමෝම අත්ඇරලා යන්න හිත හදාගෙන ඉවරයි.. එයා මේ පේන්ටින්ග්ස් කරමින් ලෝකයෙන් ඈත්වෙලා ඉන්නෙ එයාගෙ ගමනට කාලය ගන්න විතරයි.. ” නිමන්ත හිස ඔසවා චතුරි දෙස බැලුවේ ය. ඇගේ දෑස් කඳුලින් පිරී ඇත. කිසිවක් කියන්නට තැතනූ ඇය ලේන්සුවෙන් ඇස් පිසදා ගත්තා ය. මිලින්ද මේසය මත වූ ඇගේ අත මත තම වම් අත තැබුවේ ය.

“ඒ තරම් පහසුවෙන් පරාජය බාරගන්නෙ කොහොමද..?” ඔහු ඇසුවේ තමාගෙන්ම අසා ගන්නාක් මෙන් ය.

“ඒක පරාජය බාර ගැනීමක්ද ජයග්‍රහණයක්ද කියල අපි කොහොමද මල්ලි තීරණය කරන්නෙ.. ?? හැම දෙයක්ම අවිනිශ්චිතව තිබියදි එයා එයාට ගන්න පුලුවන් හොඳම මාර්ගය තෝරාගත්තා වෙන්න ඇති.. එයා පහසුවෙන් යන්න පුලුවන් ක්‍රමයක් තෝරාගෙන තියෙනවා... මං එයාට දොස් කියන්නෙ නැහැ.. අපි වුණත් කිසිම දෙයක් ගැන ඕනෑවට වඩා බලාපොරොත්තු තියාගන්නෙ ඇයි..? බලාපොරොත්තු වැඩියෙන් තිබුණ තරමට වේදනාවත් වැඩියි..”

චතුරි වහා හිස ඔසවා නිමන්ත දෙස බැලුවේ ඔහුගේ බසින් කෝපවූවාක් මෙන් ය. අලුත් කඳුලු බිඳු ඇගේ කොපුල් තල මතින් රූරා වැටෙමින් තිබුණි.

“එහෙම හිතන්න මට බැහැ අයියා.. ඒ මගේ අක්කා.. එයාට එහෙම ලේසියෙන් යන්න දෙන්න බැහැ.. අපට එයා ඕනෙ.. අපි ඒ වෙනුවෙන් කරන්න පුලුවන් අන්තිම උත්සාහයත් අන්තිම මොහොත දක්වාම කරන්න ඕනෙ..” ඈ කඳුලු මැදම කීවා ය.

නිමන්ත ඈ දෙස බලා සිටියේ කනගාටුවෙනි.

“මෙතන අපට කරන්න දෙයක් නෑ නංගි.. අපි හරිම අසරණයි..” කියා ඇයට කියන්නට ඔහුට සිතුණි. ඔහු මහත් වෑයමෙන් ඒ අදහස යටපත් කරගත්තේ ය. යථාර්ථයට මුහුණ දීම කටුක ය. එනමුදු වෙනත් විකල්පයක් නැත්නම් කළ යුත්තේ කුමක්ද? එය චතුරිට තේරුම් කර දීමට යාම තේරුමක් ඇති වැඩක් නොවන බව ඔහු දැන සිටියේ ය.

ඉදිරියේ ඇති අගාධය දෙස බලා සිටිනවා හැරෙන්නට කළ හැකි යමක් නැත. එය පුරවන්නට තරම් හැකියාවක් ශක්තියක් හෝ ක්‍රමයක් නැති කළ කරන්නට ඉතිරිව ඇත්තේ එපමණකි.

මතු සම්බන්ධයි

# ශ්‍රීලාල් ගේ කොළම

## අපේ මිනිස්සු

'අපි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් පිරිසක් සමඟ සැරයක් දකුණු අප්‍රිකාවේ සංචාරයක් කළා. එහි ඉතා ලස්සන සත්ත්ව උද්‍යානයකට අපි ගියා. එහි කුටියක කොනක කොටියෙක් නිදාගෙන හිටියා. මේ කොටියව හරියට බලාගන්න බෑ කියලා එක ප්‍රාදේශීය සභාවක සභාපති කෙනෙක් කොටියට ගලකින් ගැහුවා.

ඒ රටේ ජනගහනයෙන් 23%කට විතර ඒඩ්ස් තියන නිසා අපි අතරේ කොන්ඩම් බෙදා දීමක් සිදුවුණා. ශිෂ්ඨ සම්පන්න සමාජයක් කොන්ඩම් එකකට දක්වන ප්‍රතිචාරයක් තියනවානේ. අපේ ප්‍රාදේශීය සභා කණ්ඩායමේ අය මේ කොන්ඩම් පුම්බලා උඩ ඇරියා. රටවල් එකසිය ගානක මිනිස්සු ඇවිල්ලා ඉන්න වෙලාවක ඒ මිනිස්සු ඉස්සරහා තමයි මේ දේ කළේ.
මේ තවත් සිද්ධියක්. ආපහු ප්ලේන් එකේ එන ගමන් කතරගම ප්‍රාදේශීය සභාවේ සභාපතියි, බර්ටි ප්‍රේමලාල් දිසානායකගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියෙකුයි ගහගන්න පටන් ගත්තා. මේ ගුටි හුවමාරුව වර්ධනය වෙලා අන්තිමට ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ මුළු කණ්ඩායමම ප්ලේන් එක ඇතුළේ ගහගන්න පටන් ගත්තා. සහාය ගුවන් නියමුවා ඇවිල්ලා කිව්වා මේ ප්ලේන් එක කඩාගෙන වැටෙයි, අනේ ගහගන්න එක නවත්වන්න කියලා.

'අපේ මිනිස්සු' ගැන මේ කතා කිව්වේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා කථිකාචාර්ය අනුරුද්ධ ප්‍රදීප්. පහුගිය මාසේ මුල් සතියේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සංවිධානය කළ සම්භාෂා සංවාද මණ්ඩපයේදී. කාල වේලාව මදිකම නිසා කියන්න බැරි වුණත් ඒ වගේ කතා තොගයක්ම තමන් ළඟ තියන බවත් ඔහු කිව්වා.
විදේශීය සංචාරකයන් ප්‍රවාහනය කරන බස් රථයක රියදුරෙක් ' සතියකට විතර කලින් දිනයක 'අපේ මිනිස්සු' ගැන මට කියපු කතාවක් මේ.

'අපි ෆොරිනස්ල එක්ක සති ගණන් එක දිගට ගමන් යනවා. ටුවර් එක ඉවරවෙලා ඒ මිනිස්සු බස් එකෙන් බැහැලා ගිහිල්ලත් පැය ගානක් යනකං බස් එක ඇතුළේ සුවඳයි. කාපට්වල වැලි ටිකක් තියෙන්නෙත් බොහොම කලාතුරකින්. බස් එක සුද්ධ කරන්න කියලා දෙයක් නෑ. ඒ මිනිස්සු එක්ක ගමන් යන්න ආසා හිතෙනවා. හැබැයි බැරිවෙලාවත් අපේ මිනිස්සු එක්ක දවසක දෙකක ට්‍රිප් එකක් යන්න වුණොත් ඊට පස්සේ අනිවාර්යෙන්ම බස් එක සර්විස් දාන්න වෙනවා. ඒ තරම් ජරාව බස්එකේ. සර්විස් දාල එයාර් ෆ්‍රෙෂ්නර් එකක් ගැහුවෙ නැත්නම් අරක්කු ගඳ බස් එක පුරාම. පුදුම සත්තු ජාතියක්'

මේ සංවේදී කතා දෙකත් 'අපේ මිනිස්සු' ගැන. මට කිව්වේ ඒ මිනිස්සුන්ගේ අම්මලා. හැබැයි මගේ මාධ්‍යවේදී භූමිකාව ගැන නොදැන.

එක අම්ම කෙනෙක් අහම්බෙන් මුණගැහුණේ නාවලදී. බොහොම සැපවත් ජීවිතයක් ගෙවපු කෙනෙක් බව පෙනුමෙන් වගේම කතා බහෙනුත් තෙරුණා. තමන්ට නවතින්න මහළු මඩමක් හොයාගෙන යන අතරෙයි ඒ අම්මා මට මුණගැහුණේ. ඒ ඇයි කියලා මම ඇහුවම ඒ අම්මා කියනවා එයාගේ පුතා ඉන්නේ ඕස්ට්‍රේලියාවෙලු. දෙවෙනි කසාද බිරියට මහගෙදර බලාගන්න බාරදීල ගිහිල්ලාලු. ලේලි මේ අම්මට සළකන්නේ නැතිලු. පුතත් බිරින්දෑ ගැන හෙව්වට අම්ම ගැන හොයන්නේ බලන්නේ නැතිලු. එහෙම කියලා ටිකක් වෙලා හිස් බැල්මකින් බලාගෙන හිටපු මේ අම්ම ඊළඟට මට නාවල විවෘත විශ්වවිද්‍යාලය ළඟ ඇල පෙන්නලා කියනවා 'මෙන්න මේකට තමයි මම පනින්නේ' කියලා. ඇස් දෙකම කඳුළින් පිරිලා. පුළුවන්නම් මහළු නිවාසයක් හොයලා දෙන්න කියලා ඒ අම්මා තමන්ගේ නමයි, ලිපිනයයි මට ලියලා දුන්නා. පදිංචිය නාවල ගල්පොත්ත පාරේ. අම්මගේ නමයි, ගෙදර අංකයයි මම මේකේ ලියන්නේ නෑ. පුත්තරය දැක්කොත් ලැජ්ජ හිතෙයිනේ.

අනෙක් අම්මා මට මුණගැහුණේ වැල්ලවත්ත පසල්ස් ලේන් එකේදි. ඒ අම්මගේ පුතා විතරක් නෙවෙයි, දුවෙකුත් ඕස්ට්‍රේලියාවෙ. දුවනම් ඉදලා හිටලා කීයක් හරි එවනවලු. එහෙම එව්වම ලයිට් බිල්, වතුර බිල් වගේ අනිවාර්යය ගෙවීම් ටික කරගන්නවලු. ඒත් අනෙක් වියහියදම්වලට දෙයියන්ගේ පිහිට තමයිලු. දුව ඉදලා හිටලවත් කීයක් හරි එව්වට පුතා නම් අම්ම ඉන්නවද කියලාවත් දන්නේ නැතිලු. 'එයාගෙන් රුපියලක් ගන්නවා කියන්නේ ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වගේ තමයි' කියලා ඒ අම්මා කිව්වා. පුත්තරයගේ කෙරුවාව ගැන හිතලම ඒ අම්මගේ මානසික තත්ත්වය මේ වෙනකොට හොදටම බිඳවැටිලා. ඒ අම්මගේ නමයි, ගෙදර අංකයයි දෙකත් ඕනෙනම් කියන්න පුළුවන්. ඒ වුණාට එහෙම කරන්නේ නෑ. ඒ පුත්තරයගේ ආත්ම ගෞරවයටත් හරි නෑනේ නේද?

නිතර නිතර මේවගේ කතා අහන්න දකින්න ලැබෙනකොට හිතෙනවා ඇත්තටම 'අපේ මිනිස්සුන්ට' මොකක්ද වෙලා තියෙන්නේ කියලා? මේ වගේ සිදුවීම් ගැන කතා බහ කරමින් ඉන්න අතරේ දවසක් මම කොළඹ විශ්වවිද්‍යාලේ ශ්‍රීපාලි මණ්ඩපයේ ආචාර්ය ටියුඩර් වීරසිංහගෙන් ඇහුවා 'අපේ මිනිස්සුන්ගේ' මේ ආකාරයේ හැසිරීම්වලට හේතුව මොකක්ද කියලා. ඔහු කිව්වේ සමාජීය හේතුකාරනාවලට අමතරව 'අපේ මිනිස්සුන්ගේ' හියුමන් මැටර් එකේ ප්‍රශ්ණයක් තියනවලු.

කෙනෙකුට හිතෙන්න පුළුවන් අහඹු සිදුවීම් කීපයක් මුල්කරගෙන 'අපේ මිනිස්සු' අවතක්සේරු කරන එක වැරදියි කියලා. ඔය කියන විදිහට වෙනස් ආකාරයෙන් ක්‍රියාකරන අය කොච්චර ඉන්නවද කියලා. ඔව්. එහෙම අයත් ඉන්නවා නම් තමයි. ඒ අය මේක කියවලා හිත්වේදනාවක් ඇතිකරගන්න වුවමනා නෑ. හැබයි ආචාර්ය ටියුඩර් වීරසිංහගේ විග්‍රහයත් අහක දාන්න බෑ. මැටර් එකේ අවුල. ඒකත් බොහෝම බලවත් විදිහට තියන බව නම් පේනවා.